www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: රාජ්‍යයේ පුවත්පත සසපයට එරෙහි මරන තර්ජනයක් පලකරයි

**Sri Lanka: State-owned newspaper publishes death threat against SEP**

**විජේ ඩයස් විසිනි**

**2010 මැයි 08**

අප්‍රේල් 23 වෙනි දා, ශ්‍රී ලංකාවේ ආන්ඩුවට අයත් ඩේලි නිව්ස් පුවත්පතේ කතු වැකිය සහිත මැද පිටුවේ සමාජවාදී සමානතා පක්ෂයට (සසප) එරෙහිව පැහැදිලි මරන තර්ජනයක් එල්ල කරමින් අතිශයින්ම ප්‍රකෝපකාරී ලිපියක් පලකර තිබුනි.

"ගෞරව කිරීමට සුදුස්සෝ සහ නුසුදුස්සෝ" යන මාතෘකාව සහිත එම ලිපිය "මුදලට ගත නොහැකි" විරුද්ධවාදීන් වන හෙයින්, "නැති කර දැමිය යුතු හෙවත් මරාදැමිය යුතු" පුද්ගලයන් ලෙස, සසප ද එහි ප්‍රමුඛ සාමාජිකයින් දෙදෙනෙකු වන ප්‍රධාන ලේකම් විජේ ඩයස් හා දේශපාලන කොමිටි සාමාජිකයෙකු වන නන්ද වික්‍රමසිංහ ද හඳුන්වා දුන්නේ ය.

සමාජවාදී සමානතා පක්ෂය එම ලිපිය ද එය පලකිරීමට පුවත්පත ගත් තීන්දුව ද හෙලා දකිමින් අප්‍රේල් 30 දා, ඩේලි නිව්ස් කතුවරයාට ලිපියක් යැවීය. මැයි 6 දා, ඩේලි නිව්ස් පුවත්පත එම ලිපියේ කප්පාදු කරන ලද වර්තනයක් පල කලේ ය. එහි මරන තර්ජනයට සසපයේ විරුද්ධත්වය ප්‍රකාශ කරන ආරම්භක ඡේදය ඉන් ඉවත්කර දමා තිබුනි. සසප ලිපියට පිලිතුරක් මේ වන තෙක් ඩේලි නිව්ස් පුවත්පතේ පලවී නැත. සසපය යැවූ ලිපිය මෙහි අගට අමුනා ඇත.

ශ්‍රී ලංකාවේ දේශපාලනයේ වත්මන් සන්දර්භය තුල ඩේලි නිව්ස් ලිපියෙන් සසපයට එල්ල කරන ලද තර්ජනය බරපතලව ගනන්ගත යුතු ය. 2005 දී ජනාධිපති රාජපක්ෂ බලයට පත්වූ තැන් පටන් ආන්ඩු පාක්ෂික මිනීමරු කන්ඩායම් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද ප්‍රමුඛ පුවත්පත් කලාවේදීන් ද ඇතුලු සිය ගනනක් ජනයා මරා දමනු ලැබූහ; නැතහොත් "අතුරුදහන් කර දමනු" ලැබූහ.

2006 මැද දී දිවයින යලිත් වරක් සිවිල් යුද්ධයට ඇද දැමූ ජනාධිපති රාජපක්ෂ දහස් ගනන් සිවිල් ජීවිත වනසා දමමින් බෙදුම්වාදී එල්ටීටීඊයට එරෙහිව යුද්ධ ප්‍රහාරයක යෙදුනි. පසුගිය මැයි මාසයේ දී එල්ටීටීඊය යුද්ධමය වශයෙන් පරාජය කල ආන්ඩුව ශතවර්ෂ කාලක සිවිල් යුද්ධය මගින් ගොඩනගාගත් පොලිස් රාජ්‍ය තන්ත්‍රය කම්කරු පන්තියට විරුද්ධව පාවිච්චි කිරීම සඳහා තවමත් තබා ගෙන සිටී.

ග්‍රීසිය මෙන්ම ශ්‍රී ලංකාව ද තදබලව නයගැතිව සිටී. ලංකාව සම්බන්ධයෙන් ගතහොත් නයගැතිකමට බොහෝ දුරට හේතු වී ඇත්තේ රාජපක්ෂගේ දැවැන්ත යුද වියදම් ය. පසුගිය වසරේ මැද දී නය ගෙවීම් පැහැර හැරීමේ තත්වයකට මුහුන දී සිටි රාජපක්ෂ ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් දෙන ලද ඩොලර් බිලියන 2.6 ක හදිසි නය මුදල මගින් පන බේරා ගත්තේ ය. එම නය මුදලේ එක් කොන්දේසියක් වන්නේ පසුගිය වසරේ දී සියයට 9.7ක් වූ අයවැය හිඟය 2011 වන විට සියයට 5 දක්වා පහත දැමිය යුතු ය යන්නය. ගතවූ වර්ෂයේ අයවැය ලේඛනයෙන් හරි අඩකට වඩා යොදවන ලද්දේ නය ගෙවීම් සඳහා ද යුද්ධය සඳහා ද ය. මේ අවුරුද්දේ ද එම වියදම් අඩු කර නැත. මෙහි ප්‍රතිපලයක් වශයෙන් රාජපක්ෂට රාජ්‍ය අංශයේ සේවාවන් ද රැකියාවන් ද දරුනු ලෙස කප්පාදු කිරීමට හා බදු දැවැන්ත ලෙස වැඩිකිරීමට සිදු වනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මෙම තිත්ත කසාය දැනට ම ග්‍රීසියට ගිල්ලනු ලබමින් පවත්නා අතර එයට එරෙහිව එරට කම්කරු පන්තිය දැනට ම මහා වැඩවර්ජන හා විරෝධතා රැල්ලකට අවතීර්නව සිටී. ශ්‍රී ලංකාවේ ද මෙවැනි තත්වයක් උද්ගත වීම අනිවාර්ය ය. සමාජවාදී සමානතා පක්ෂය "මුදලට ගත නොහැකි පක්ෂයක් යයි" දැනටම පහර එල්ල කර ඇත්තේ ඒ නිසා ය. ආන්ඩුව ද පාලක පන්තිය ද අන් සියල්ලටමත් වඩා බියවැද සිටින්නේ කම්කරු පන්තිය සමාජවාදී

ජාත්‍යන්තරවාදය ධජය යටතේ ස්වාධීන දේශපාලන බලයක් ලෙස ඉදිරියට එතැයි කියා ය. එවන් ඉදිරිදර්ශනයක් සඳහා ලංකාව තුල සටන්වැද ඇති එකම පක්ෂය නම් සමාජවාදී සමානතා පක්ෂය සහ එහි පෙර ගමන්කරුවා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයයි.

දූෂ්ට ඩේලි නිව්ස් ලිපියේ කතුවරයා වන මාලින්ද සෙනෙවිරත්න එන්නේ යටගිය ට්‍රොට්ස්කිවාදී ලංකා සමසමාජ පක්ෂයට හිතවත්කම් දැක්වූ පවුලකිනි. ඔහු හැදී වැඩුනේ ලංකා සමසමාජ පක්ෂය 1964 දී සිරිමාවෝ බන්ඩාරනායකගේ ධනපති පක්ෂයට එකතුවීම මගින් සමාජවාදී ජාත්‍යන්තරවාදය පාවාදීම නිසා පැනනැගි දේශපාලන ව්‍යාකූලත්වය මැද්දැවේ ය.

සෙනෙවිරත්න සරසවි ශිෂ්‍යයෙකු ලෙස දෙමල විරෝධී වර්ගවාදය සහ පරිසර ගැටලු අච්චාරු කර ගත් ජනතා මිතුරෝ නම් සංවිධානය සමග සම්බන්ධව සිටියේ ය. චම්පික රනවක විසින් නායකත්වය දෙන ලද මෙම කන්ඩායම පසුව ජාතික හෙල උරුමය නම් සිංහල අන්තවාදී පක්ෂය බවට විකාශනය විය. කලින් ආන්ඩුව යටතේ පරිසර ඇමති වූ රනවක දැන් බලශක්ති ඇමතිවරයා වන අතර ජනාධිපතිගේ සමීප පෞද්ගලික උපදේශකයෙක් ද වේ. සෙනෙවිරත්න ජාතික හෙල උරුමය සංවිධානයේ සාමාජිකයෙකු නොවූව ද ජාත්‍යොත්තමවාදී දේශපාලනය තරයේ වැළඳගනිමින් ආන්ඩුවේ ප්‍රචාරක හොරනෑවක් වන ඩේලි නිව්ස් පුවත්පතේ ලියනප්පු කෙනෙකු ලෙස තැනක් හදාගෙන සිටී.

සෙනෙවිරත්නගේ දේශපාලන ඉතිහාසය ඔහුගේ ලිපිලේඛන වලට සුවිශේෂ දූෂ්ට භාවයක් අත් කර දෙයි. නව සමසමාජ පක්ෂය සහ එක්සත් සමාජවාදී පක්ෂයේ යටගිය - වම්මුන් මෙන් නොව, සමාජවාදී සමානතා පක්ෂය වනාහී විප්ලවවාදී සමාජවාදය සඳහා සටන් වදින එකම සංවිධානය බව වටහාගැනීමට සෑහෙන තරම් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඉතිහාසය පිලිබඳ දැනුමක් ඔහුට තිබේ. ඔහුගේ ප්‍රතිචාරය උකහාගෙන ඇත්තේ - අල්ලස් දී හෝ බිය කර පෙල ගස්සා ගත නොහැකි අය මරාදැමිය යුතුය යන හෙල උරුමය සංවිධානයේ මැරවර වාර්තාවෙනි.

සමාජවාදී සමානතා පක්ෂයට එරෙහි තර්ජනය වනාහී රාජපක්ෂ පාලන තන්ත්‍රය තමන්ගේ ආර්ථික ප්‍රහාර වැඩ සටහනට එරෙහිව වැඩ කරන ජනතාවගෙන් පැනනැගියහැකි කුමන ප්‍රතිරෝධයක් වුව මර්දනය කර දැමීම සඳහා ඕනෑම ක්‍රමයන් යොදා ගැනීමට සූදානම්ව සිටින්නේ ය යන්න ගැන මුලු කම්කරු පන්තියටම කරනු ලැබ ඇති බරපතල අනතුරු හැඟවීමකි. යුද්ධය අවසන් වී අවුරුද්දක් ගතවූ පසුව ද මැයි 5 බදාදා ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව යලිත් හදිසි නීතිය සම්මත කර ගැනීම අහම්බයක් නොව රාජපක්ෂ අලුතින් ප්‍රකාශ කර ඇති "ජාතිය ගොඩනැගීම සඳහා වූ ආර්ථික යුද්ධය" සඳහා සිවිල් යුද්ධයේදී යොදාගත් ජාතියේ ම දරුනු පියවරයන් යොදාගනු ඇතැයි යන්න පිලිබඳ අනතුරු හැඟවීමකි.

වැඩ කරන ජනතාව මෙයින් ගතයුතු අත්‍යවශ්‍ය දේශපාලන පාඩම් උගතයුතු යයි සමාජවාදී සමානතා පක්ෂය කියා සිටී. ආන්ඩුවේ සැලසුම්වලට එරෙහි ප්‍රතිප්‍රහාරයක් තුල ගම්බද දුප්පත් ජනතාවට නායකත්වය සැපයීම සඳහා කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම තවදුරටත් කල් තැබිය නොහැකිය. එවන් ව්‍යාපාරයක් ගොඩනැගියහැකි වන්නේ ජාත්‍යන්තරව සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් සඳහා අරගලය මගින් පමනි. එවන් අරගලයකට අවශ්‍ය නායකත්වය ලෙස සමාජවාදී සමානතා පක්ෂය ගොඩනැගීම සඳහා එම පක්ෂයට එකතු වන ලෙස අපි කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් ඉල්ලා සිටිමු.

සමාජවාදී සමානතා පක්ෂය ඩේලි නිව්ස් පුවත්පතට පහත සඳහන් ලිපිය යැවීය.

කර්තෘ,

ඩේලි නිව්ස් පුවත්පත

මහත්මයානනි,

අප්‍රේල් 23 දා ඩේලි නිව්ස් කලාපයේ "ගෞරව කරනු ලැබීමට සුදුස්සෝ සහ නුසුදුස්සෝ" යන මැයෙන් පල කරන ලද ප්‍රකෝපකාරී ලිපිය පිලිබඳව හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රධාන ලේකම් හැටියට මගේ පක්ෂයේ සද්කෝපවත් විරුද්ධත්වය වාර්තාගත කිරීමට මම කැමැත්තෙමි.

සමාජවාදී සමානතා පක්ෂයට ද එහි නායකත්වයට ද එරෙහිව ත්‍රස්තවාදී ක්‍රියාවක් උසිගැන්වීමට දරන ලද ප්‍රයත්නයක් හැටියට පමනක් ම අර්ථ කථනය කල හැකි මෙම ලිපියේ කතෘ මාලිංග සෙනෙවිරත්න එහි

මෙසේ ලියා තිබුනිඃ "විරුද්ධ පක්ෂයෙන් සියයට 99ක් මිල දී ගත හැකි යයි ද සියයට 1ක් නැති කර දැමිය හෙවත් මරාදැමිය යුතු යයි ද සමහරු කියති." සෙනෙවිරත්න ඉක්බිතිව සමාජවාදී සමානතා පක්ෂය ද එහි ප්‍රධාන සාමාජිකයන්ගෙන් දෙදෙනෙකු වන විජේ ඩයස් (මා) සහ නන්ද වික්‍රමසිංහ (පොඩි වික්ස්) ද එම සියයට 1ට අයත් යයි කියා සිටී.

සෙනෙවිරත්න සිය ද්වේශ හරිත නරුමත්වය මෙසේ වගුරයිඃ "පොඩි වික්ස්ට සහ විජේ ඩයස්ට ප්‍රනාමය කිරීමට මම කැමැත්තෙමි. ඔවුන් දේශපාලන වශයෙන් අවංක ය මිලදී ගත නොහැකි ය."

අති දක්ෂිනාංශික ජාතික හෙල උරුමයේ පෙර ගමන්කරුවන් සමග තම දේශපාලනය ආරම්භ කල සෙනෙවිරත්න හරඹ කරන වංචනික වර්නනා පදවලට අප රැවටෙන්නේ නැත. ජාතික හෙල උරුමය සංවිධානය දැන් රාජපක්ෂ ආන්ඩුවේ හවුල්කරුවෙකි. මෙම ලිපිය ලිවීමේ ලා සෙනෙවිරත්නගේ අධ්‍යාසය වූයේ සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි ජාතික හෙල උරුමයේ ද අනෙකුත් දක්ෂිනාංශික සංවිධානයන්ගේ ද අවධානය යොමු කිරීමට බව පැහැදිලි ය.

ආන්ඩුවේ පුවත්පතක් වන ඩේලි නිව්ස් පුවත්පත සෙනෙවිරත්නගේ ලිපිය පල කිරීම මගින් ඔහුගේ ප්‍රකෝපකාරී සැලසුම්වල සහකරුවෙක් බවට පත්ව ඇත. රාජ්‍ය තන්ත්‍රය තුල සිටින්නා වූ වර්ගවාදී බලවේගයන් සසපයට විරුද්ධව උසිගැන්වීම සඳහා සෙනෙවිරත්න අපගේ සංවිධානය "ඊලාම්වාදී" සංවිධානයක් ලෙස විස්තර කරයි. කොලඹ ආන්ඩු එකපිට එක දෙමල ජනයාට විරුද්ධව ගෙනයනු ලැබූ ප්‍රතිගාමී යුද්ධයට සමාජවාදී සමානතා පක්ෂය එකහෙලාම විරුද්ධ විය. එසේම සුප්‍රකටව පවත්නා පරිදි සමාජවාදී සමානතා පක්ෂය ශ්‍රී ලංකාව තුල ද ජාත්‍යන්තරව ද එල්ටීටීඊයේ ධනේශ්වර බෙදුම්වාදී ක්‍රියාමාර්ගයට විරුද්ධ විය.

අපගේ පක්ෂය ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩු සංගමයක් යන ධජය යටතේ සිංහල සහ දෙමල ජනතාවගේ එක්සත් භාවය සඳහා සටන් වැද ඇත. අද ද සමාජවාදී සමානතා පක්ෂයේ ඉදිරිදර්ශනය එයයි.

සමාජවාදය සඳහා ද සියලු වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් සඳහා ද වන අපගේ අරගලය - ඩේලි නිව්ස් පුවත්පතේ පිටු තුල පෝෂනය කරන ලද වර්ගය ද ඇතුලු - කුමන ජාතියේ හෝ තර්ජන මගින් පසුබැස්විය නොහැක.

විජේ ඩයස්

ප්‍රධාන ලේකම්

සමාජවාදී සමානතා පක්ෂය

© www.wsws.org